SRI LANKA

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

## අදියර I විභාගය - 2023 ජනවාරි

## යෝජිත උත්තර

# (103) ආර්ථික විද්‍යාව (ECN)

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය
නො. 540, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.
දුරකථන: 011-2-559 669

**මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි**

## ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2023 ජනවාරි

## (103) ආර්ථික විද්‍යාව

# යෝජිත උත්තර

(මුළු ලකුණු 40) **A කොටස**

***පළමුවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර:***

**1.1** (2)

**1.2** (1)

**1.3** (3)

**1.4** (2)

**1.5** (1)

**1.6** (2)

**1.7** (2)

**1.8** (1)

**1.9** (3)

**1.10** (2)

**1.11** ධන

**1.12** ඒකාධිකාරී තරගකාරී

**1.13** අසත්‍යයි

**1.14** සත්‍යයි

**1.15**

ආර්ථිකය සමන්විත ව ඇති එක් එක් අංශ, ආයතන, පුද්ගලයන් හා ආර්ථික විචල්‍යයන් ආදී කුඩා ඒකකයන් වෙන් වෙන් වශයෙන් ගෙන ඒවායේ හැසිරීම අධ්‍යයනය කිරීම **සූක්ෂම ආර්ථික විද්‍යාවයි**. එනම් ආර්ථික පද්ධතියක් තුළ සිටින පාරිභෝගිකයින්, නිෂ්පාදකයන්, සේවකයන් වැනි විවිධ ඒකකයන් වෙන් වෙන් වශයෙන් ගනු ලබන තීරණ විග්‍රහ කිරීම සූක්ෂම ආර්ථික විද්‍යාව තුළින් සිදු කෙරේ. එය හුදෙක් මානව තේරීම් සහ සම්පත් වෙන් කිරීම පිළිබඳ අවධානය යොමු කරයි.

උදාහරණ:

- වෙළෙඳපොළක ඉල්ලුම සහ සැපයුම මත භාණ්ඩයක මිල තීරණය වේ
- පාරිභෝගිකයෙකු ගේ හැසිරීම
- නිෂ්පාදන ආයතනයක පිරිවැය, ආදායම සහ ලාභ තීරණය වීම
- හිඟකම, තේරීම, සම්පත් වෙන් කිරීම සහ ආවස්ථික පිරිවැය පිළිබඳ අධ්‍යයනය කිරීම

ආර්ථික පද්ධතිය සමස්තයක් ලෙස ගෙන එහි ක්‍රියාකාරීත්වය, කාර්යසාධනය හා ව්‍යුහය ආදිය අධ්‍යයනය කිරීම **සාර්ව ආර්ථික විද්‍යාවයි**. සමස්ත ආර්ථිකයක ක්‍රියාකාරිත්වය ඇති වන්නේ ආර්ථිකයේ එක් එක් අංශ, ආයතන, පුද්ගලයන් හා ආර්ථික විචල්‍යයන් ආදී කුඩා ඒකක සියල්ලේ ම, එකතුවෙනි. ඒ අනුව එම අංශවල, සමස්ත ක්‍රියාකාරිත්වයත් එම ක්‍රියාකාරිත්වය තීරණය කෙරෙන සාධකයක් එම ක්‍රියාකාරිත්වය තුළින් පැන නගින ප්‍රතිඵල සහ ප්‍රශනත් සාර්ව ආර්ථික විද්‍යාව තුළින් අධ්‍යයනය කෙරේ.

සාර්ව ආර්ථික විද්‍යාව තුළින් පහත ක්ෂේත්‍ර ආවරණය වේ.

- සමස්ත නිමවුම, ආදායම සහ වියදම
- උද්ධමනය, මිල මට්ටම සහ මුදල් සැපයුම
- විනිමය අනුපාතය, විදේශ වෙළෙඳාම, ගෙවුම් ශේෂ
- සේවා නියුක්තිය, සේවා වියුක්තිය සහ ආර්ථික වර්ධනය
- ආර්ථික උත්පාත, අවපාත සහ පසුබැසීම

**1.16**

ගැනුම්කරුවන්ගේ මුදල් ආදායම ඇතුලු අනෙකුත් සාධක නොවෙනස් ව තිබිය දී සලකා බලන භාණ්ඩයේ මිල වෙනස්වීම හේතු කොට ගෙන මූර්ත ආදායමේ ඇතිවන වෙනස්වීම මත සළකා බලන භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය වෙනස්වීම මිල වෙනස්වීමක ආදායම් ප්‍රතිවිපාකය නම් වේ.

**1.17**

**තේරීම:**

ඕනෑ ම ආර්ථිකයක් විසින් මුහුණ දෙන ගැටලුවක් වන්නේ අසීමිත මිනිස් වුවමනාවන්ට සාපේක්ෂව පවත්නා සම්පත් ප්‍රමාණවත් නොවීමයි. මේ අනුව පවත්නා සම්පත්වලින් පවත්නා අසීමිත මිනිස් වුවමනා සපුරා ගැනීමට මිනිසුන් පෙළඹේ. ආර්ථික සම්පත්වල ඇති ප්‍රධාන ලක්ෂණයක් වනුයේ විකල්ප ප්‍රයෝජන අවස්ථා පැවතීමයි. මෙම විකල්ප ප්‍රයෝජන අවස්ථා සියල්ල ම එකවර ඉටු කර ගැනීමට නොහැකි බැවින් එම විකල්ප අවස්ථා අතුරින් හොඳම විකල්ප අවස්ථාවක් තෝරා ගැනීමට ආර්ථිකයකට සිදු වේ.

උදාහරණය: ශිෂ්‍යයෙකුට ඔහු/ඇය සතුව රු.500/=ක් තිබේ නම්, පහත විකල්ප විකල්ප ඇත. ඔහුගේ උපකාරක පන්ති ගාස්තු පියවීම, ගණක යන්ත්‍රයක් මිලදී ගැනීම හෝ බැංකු ගිණුමක තැන්පත් කිරීම සළකා බැලිය හැකිය.

aat SRI LANKA

**ආවස්ථික පිරිවැයඃ**


ආවස්ථික පිරිවැය ආර්ථික විද්‍යාවේ ඉතාමත් වැදගත් සංකල්පයක් වන අතර ආර්ථික තීරණවලදී සැලකිල්ලට ගනු ලබන වැදගත් සාධකයකි. සම්පත් හිඟ නිසාත් ඒවායේ විකල්ප ප්‍රයෝජන පවතින නිසාත් විකල්ප අතුරින් එක් විකල්ප අවස්ථාවක් තෝරා ගැනීම නිසා කැප කිරීමට සිදු වන ඊළඟ හොඳම විකල්ප අවස්ථාවේ වටිනාකම ආවස්ථික පිරිවැයයි.

**1.18**

1 ආර්ථික හා මිල ස්ථායීතාව පවත්වාගෙන යාම
2 මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාව පවත්වාගෙන යාම
3 මූල්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීම
4 ව්‍යවහාර මුදල් නිකුත් කිරීම හා බෙදාහැරීම
5 රාජ්‍ය ණය කළමනාකරණය
6 සේවක අර්ථසාධක අරමුදල කළමනාකරණය හා පරිපාලනය
7 නිල විදේශ සංචිත කළමණාකරණය
8 විනිමය අනුපාතික ප්‍රතිපත්ති මෙහෙයවීම
9 නියෝජ්‍යාතන කටයුතු
10 රජයේ උපදේශක බැංකුකරු හා මූල්‍ය නියෝජිත ලෙස කටයුතු කිරීම
11 කුඩා පරිමාණ මූල්‍යකරණය කටයුතු සහ ග්‍රාමීය ණය යෝජනා වැඩසටහන් පවත්වාගෙන යාම
12 අවසාන ණය දෙන්නා වීම

**1.19**

උපේක්ෂා වක්‍රයකින් පෙන්නුම් කෙරෙනුයේ ඔහුගේ/ඇයගේ අයවැය සීමාවන් සැලකිල්ලට ගෙන, කිසියම් නිශ්චිත මට්ටමක තෘප්තියක් ලබා ගැනීම සඳහා භාණ්ඩ වර්ග දෙකකින් පරිභෝජනය කළ හැකි විවිධ සංයෝගයන්ය. උපේක්ෂා වක්‍ර විශ්ලේෂණයට අනුව, පාරිභෝගික සමතුලිතතාවය යනු ලබා දී ඇති පාරිභෝගිකයාගේ උපේක්ෂා වක්‍රයේ ඇති ඉහළ ම ළඟා කර ගත හැකි උපේක්ෂා වක්‍රය වෙත අයවැය රේඛාව ස්පර්ශ වන ලක්ෂ්‍යයට අනුරූප වන භාණ්ඩවල එකතුවකි. මෙම ලක්ෂ්‍යයේදී අයවැය රේඛාවේ බෑවුම උපේක්ෂා වක්‍රයේ බෑවුමට සමාන වේ.



**1.20 තිරසාර සංවර්ධනය**

පරිසරයේ ගුණාත්මක බව ආරක්ෂා කරමින් නිෂ්පාදන මට්ටම් ඉහළ නැංවීම සහ සංවර්ධනයේ ප්‍රතිලාභ ජනතාව අතර බෙදී යන බව සහතික කිරීම තුළින් රටක් තිරසාර සංවර්ධනයක් අත්කර ගැනීමට සමත් වේ. එමෙන්ම තිරසාර සංවර්ධනය සඳහා ආර්ථික, සමාජීය හා පාරිසරික යන අංශයන්ගේ තුලනාත්මක වර්ධනයක් සිදු විය යුතුය. වෙනත් වචන වලින් කිවහොත්, අනාගත පරම්පරාවට තම අවශ්‍යශතා සපුරා ගැනීමට ඇති ඉඩකඩ අහිමි නොකරමින් වර්තමාන පරම්පරාව තම අවශ්‍යතා සපුරා ගැනීම තිරසාර සංවර්ධනය ලෙස අදහස් කෙරේ.

*(එක් කොටසකට ලකුණු 02, මුළු ලකුණු 40)*

***A කොටසෙහි අවසානය***

## *දෙවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

*පරිච්ඡේදය 02 - ඉල්ලුම, සැපයුම, හා සමතුලිතය හා රජය මැදිහත් වන ආකාරය*

**(a)**

(i) Qd = 17 – 0.05P
Qs = -1 + 0.1P

**සමතුලිතයේදි ;** Qd = Qs

17 – 0.05P = -1 + 0.1P
18 = 0.1P + 0.05P
18 = 0.15P
**120 = P**

*Qd සමීකරණයට ආදේශනය*

Qd = 17 – 0.05P
= 17 – (0.05×120)
= 17 – 6
= **11 (ඒකක)**

Or

*Qs සමීකරණයට ආදේශනය*

Qs = -1 + 0.1P
= -1 + (0.1×120)
= -1 + 12
= **11 (ඒකක)**

**සමතුලිත මිල – රු. 120/-**
**සමතුලිත ප්‍රමාණය – ඒකක 11 කි**

*(ලකුණු 04)*

(ii) **රු.30/= ක ඒකක බද්දෙන් පසු නව සැපයුම් සමීකරණය**

Qs = -1 + 0.1 (P – 30)
= -1 + 0.1P – 3
= -4 +0.1P

Qd = 17 – 0.05P
Qs = -4 +0.1P

**සමතුලිතයේදි ;** Qd = Qs

17 – 0.05P = -4 + 0.1P
21 = 0.1P + 0.05P
21 = 0.15P
**140 = P**

Qd සමීකරණයට ආදේශනය

Qd = 17 – 0.05P
= 17 – (0.05×140)
= 17 – 7
**= 10 (ඒකක)**

Or

Qs සමීකරණයට ආදේශනය

Qs = -4 + 0.1P
= -4 + (0.1×140)
= -4 + 14
**= 10 (ඒකක)**

**සමතුලිත මිල – රු. 140/-**
**සමතුලිත ප්‍රමාණය – ඒකක 10 කි**

*(ලකුණු 03)*

**(b)**

පාරිභෝගික සමතුලිතය ලෙස අදහස් කරනුයේ කිසියම් පාරිභෝගිකයෙකු තම ආදායමට යටත්ව උපයෝගීතාව උපරිම කරන අවස්ථාවයි. තාර්කික පාරිභෝගිකයෙකු වෙළෙඳපොළේ තම සමතුලිත පරිභෝජන මට්ටම තෝරාගන්නා ආකාරය හඳුනා ගැනීම සඳහා ආර්ථික විද්‍යාඥයින් ප්‍රධාන ප්‍රවේශ දෙකක් ඉදිරිපත් කරයි.

*(ලකුණු 03)*
*(මුළු ලකුණු 10)*

## තුන්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

**පරිච්ඡේදය 01 - ව්‍යාපාර පරිසරයට අදාළ ආර්ථික සංකල්ප හා ආර්ථික පද්ධති**

**(a)**

**ආර්ථික භාණ්ඩ**

ආර්ථික භාණ්ඩ යනු සැපයුමෙහි හිගකමක් දක්නට ලැබෙන නිෂ්පාදනයේ දී හෝ පාරිභෝජනයේ දී ආවස්ථික පිරිවැයක් වැය වන භාණ්ඩ හා සේවාවන් ය. මෙම භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන්නේ හිඟ සම්පත් උපයෝගී කර ගනිමින් සහ සාධක යෙදවුම් ඒකාබද්ධ කිරීමෙනි.

උදා- ආහාර
ඇඳුම්
නිවාස
ගොඩනැගිලි
පාසල් පොත්

**ආර්ථික නොවන භාණ්ඩ**

ආර්ථික නොවන භාණ්ඩයක් යනු සැපයුමක් පවතින විට ශුන්‍ය මිලක දී අසීමිතව පාරිභෝජනය කළ හැකි භාණ්ඩ වේ. එනම් මිනිසාගේ මැදිහත් වීමක් නොමැතිව ස්භාවදහමේ දායාදයක් ලෙස ලැබී ඇති භාණ්ඩයන් ය. මෙකී භාණ්ඩ සම්බන්ධයෙන් මිනිසාගේ මැදිහත් වීමක් නොපවතින නිසා නිෂ්පාදනයේ දී හෝ පාරිභෝජනයේ දී සම්පත් පිරිවැයක් හෝ ආවස්ථික පිරිවැයක් හෝ නොපවති.

උදා- හිරු එළිය
වාතය
ජලය

*(ලකුණු 04)*

**(b)**

| ප්‍රමාණය | මුළු විචල්‍ය පිරිවැය (TVC) | සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) |
|---|---|---|
| 1 | 150 | **150** |
| 2 | 250 | **125** |
| 3 | 330 | **110** |

$$\textbf{AVC} = \frac{\textbf{TVC}}{\textbf{Q}}$$

*(ලකුණු 03)*

**(c)**

**ආන්තික පිරිවැය**

නිමවුම එක් ඒකකයකින් වැඩි කරන විටදී මුළු පිරිවැයට අලුතෙන් එකතු වන ප්‍රමාණය ආන්තික පිරිවැය ලෙස හැඳින්වේ. මුළු පිරිවැයේ වෙනස නිමවුමේ වෙනසින් බෙදීමෙන් ආන්තික පිරිවැය ලැබේ.

ආන්තික පිරිවැය = $\dfrac{\text{මුළු පිරිවයේ වෙනස}}{\text{නිමවුමේ වෙනස}}$

$$MC = \Delta TC / \Delta Q$$

**ආන්තික අයහාරය**

නිමවුම එක් ඒකකයකින් වැඩි කරන විට දී මුළු අයහාරයට අලුතෙන් එකතු වන ප්‍රමාණය ආන්තික අයහාරය ලෙස හැඳින්වේ. මුළු අයහාරයේ වෙනස නිමවුමේ වෙනසින් බෙදීමෙන් ආන්තික අයහාරය ලැබේ.

ආන්තික අයහාරය = $\dfrac{\text{මුළු අයහාරයේ වෙනස}}{\text{නිමවුමේ වෙනස}}$

$$MR = \Delta TR / \Delta Q$$

*(ලකුණු 03)*
*(මුළු ලකුණු 10 යි)*

## *හතරවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

***පරිච්ඡේදය 05 - මූල්‍ය පද්ධතිය, මුදල් හා සාමාන්‍ය මිල මට්ටම***

**(a)** විද්‍යුත් මුදල් භාවිතය සඳහා හේතු

1. එහි ප්‍රායෝගිකත්වය
2. පහසු සහ ඉක්මන් බේරුම්කරණය පාරිභෝගිකයින් ආකර්ෂණය කරයි
3. කාර්යක්ෂම ගනුදෙනු කාලය
4. ගෙවීම් ක්‍රියාවලියේ සරල බව
5. මුදල්වලට වඩා ආරක්ෂාව

6 ජාත්‍යන්තර ගෙවීම් සිදු කළ හැකි වීම

7 අන්තර්ජාල බැංකුකරණයට සම්බන්ධ කළ හැක වීම

8 වාණිජ බැංකු අතර තරගය

*(ලකුණු 02)*

**(b) ණය ශ්‍රේණිගත කිරීම පහත දැමීමට මූලික වූ හේතු දෙකක්**

පහත සඳහන් කර ඇති සාධක, තනි තනිව හෝ සාමූහිකව, සෘණ ශ්‍රේණිගත කිරීමට/අඩු ශ්‍රේණිගත කිරීම්වලට හේතු විය හැක.

1 අභියෝගාත්මක දේශීය මූල්‍යකරණ දැක්ම

2 බාහිර ණය ප්‍රතිව්‍යුහගත කිරීම

3 බැංකු අංශය දැඩි ද්‍රවශීලතා ගැටලු වලට මුහුණ දීම

4 අය-වැය මූල්‍ය ඒකාග්‍රතාවය අරමුණු කිරීම

5 දේශපාලන අවදානම ඉදිරි මූල්‍ය දැක්ම මත බර වීම

6 ඉහළ උද්ධමනය

7 විදේශ ණය ගෙවීමට නොහැකි වීම

8 විදේශ සංචිත අඩුවීම

9 සංචාරක ව්‍යාපාරය වැනි ක්ෂේත්‍ර හරහා ආදායම් ඉපැයීමට ඇති නොහැකියාව මූල්‍ය අවකාශය පටු වීමට හේතු වේ

10 රටේ ණය සේවා ධාරිතාව අඩු වීම

11 නිල මූලාශ්‍රවලින් ලැබෙන අරමුදල් ප්‍රමාණවත් නොවීම

12 රටේ ඉහළ මූල්‍ය හිඟයක් පැවතීම

13 රට තුළ දැඩි ආර්ථික සංකෝචනයක් ඇතිවීම

SRI LANKA

*(ලකුණු 02)*

**(c)**

ආර්ථික විද්‍යා ක්ෂේත්‍රයේ, "අධි උද්ධමනය" යන යෙදුමෙන් අදහස් කරන්නේ යම් නිශ්චිත කාල පරිච්ඡේදයක් තුළ සියලු ම භාණ්ඩ හා සේවාවල මිල පාලනයකින් තොරව ඉහළ යන තත්ත්වයකි. වෙනත් වචන වලින් කිවහොත්, අධි උද්ධමනය යනු අධික වේගයෙන් සිදුවන උද්ධමනයයි. පහත සඳහන් වන්නේ අධි උද්ධමනයේ ප්‍රතිවිපාක වේ.

**1. ක්‍රය ශක්තිය අඩු වීම**

මෙය උද්ධමනයේ ප්‍රාථමික හා වඩාත් ම පැතිරුණු බලපෑමයි. කාලයත් සමග සමස්ත මිල ඉහළ යාම නිසා පාරිභෝගිකයින්ගේ මිලදී ගැනීමේ ශක්තිය අඩු වී ක්‍රමානුකූලව පරිභෝජන මට්ටම අඩු වේ.

**2. ජීවන තත්ත්වය අඩු කිරීම**

උද්ධමනය සමග මූර්ත ආදායම අඩු වන විට, පාරිභෝගිකයින් ඔවුන්ගේ අත්‍යවශ්‍ය මිලදී ගැනීම් අඩු කරයි. එය අවසානයේ පාරිභෝගිකයන්ගේ ජීවන තත්ත්වයට බලපායි.

**3. පොලී අනුපාත ඉහල දැමීම**

රට තුළ මුදල් සැපයුම අඩු කිරීම සඳහා පොලී අනුපාතිකය ඉහළ නැංවීම මගින් රටේ අධි උද්ධමනකාරී තත්ත්වය පාලනය කිරීමට රජය සහ මහ බැංකු සිය බලය භාවිත කරයි. එමගින් වැඩි මුදලක් ණය පොලී ලෙස ගෙවීමට සිදුවේ.

**4. කෙටි කාලීනව ඉතුරුම් වැඩි කිරීම**

වැඩිවන උද්ධමනය ඉතිරිකිරීම අධෛර්යමත් කරයි, මන්ද එය කාලයත් සමග ක්‍රය ශක්තිය අඩු කර ඉතිරිකිරීම් අඩු කරන බැවිනි. එම තත්ත්වය පාරිභෝගිකයන් වියදම් කිරීමට සහ ව්‍යාපාර ආයෝජනය කිරීමට දිරිමත් කළ හැක.

**5. දේශීය මුදල් අවප්‍රමාණය වීම**

විදේශ විනිමය වෙළෙඳපොළවල, අනෙකුත් මුදල්වලට සාපේක්ෂව එහි සාපේක්ෂ වටිනාකම පහත වැටීම නිසා අධිඋද්ධමනය වේගයෙන් දේශීය මුදල් අවප්‍රමාණය කරයි. මෙම තත්ත්වය දේශීය මුදල් හිමියන්ට ඔවුන්ගේ වත්කම් අඩු කිරීමට සහ වඩා ස්ථාවර විදේශ මුදල් වෙත මාරු වීමට පොළඹවනු ඇත.

**6. අනවශ්‍ය ලෙස මුදල් බැදීම**

අධි උද්ධමනයේ ප්‍රතිඵලයක් ලෙස පසුකාලීනව ඉහළ මිලක් ගෙවීම වළක්වා ගැනීමේ උත්සාහයක් ලෙස, පුද්ගලයන් බොහෝ විට උපකරණ, යන්ත්‍රෝපකරණ සහ ස්වර්ණාභරණ වැනි කල් පවතින භාණ්ඩ සඳහා ආයෝජනය කරයි. උද්ධමනකාරී අවස්ථාවකදී, මිනිසුන් පැවැත්ම උදෙසා අයිතම ගබඩා කිරීමට පටන් ගනී. කෙසේ වෙතත්, එම පරිචය විෂම චක්‍රයක් ඇති කරයි මිල ඉහළ යන විට, මිනිසුන් වැඩි වැඩියෙන් භාණ්ඩ රැස් කරයි, අනෙක් අතට භාණ්ඩ සඳහා ඉහළ ඉල්ලුමක් ඇති කර මිල තවදුරටත් වැඩි කරයි. අධි උද්ධමනය දිගටම පවතී නම්, එය සෑම විටම පාහේ විශාල ආර්ථික කඩාවැටීමක් ඇති කරයි.

*(ලකුණු 06)*
*(මුළු ලකුණු 10 යි)*

## *පස්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

***පරිච්ඡේදය 06 - අන්තර්ජාතික වෙළෙඳාම සහ විදේශ විනිමය වෙළෙඳපොළ***

**(a) ඩොලර් ඉල්ලුම් කිරීමට හේතු**

1. ජාත්‍යන්තර විශ්වවිද්‍යාල ගාස්තු / පාඨමාලා ගාස්තු ගෙවීමට
2. විදේශ රටවලින් ආනයනය කරන ලද භාණ්ඩ හා සේවා සඳහා ගෙවීමට
3. විදේශ ගමන් සඳහා
4. වෙනත් ජාත්‍යන්තර ගනුදෙනු පියවීමට
5. විදේශ රටවල වත්කම් මිලදී ගැනීමට
6. විදේශ ණය ආපසු ගෙවීම
7. විදේශ ණය සඳහා පොලී ගෙවීම
8. විදේශයන්හි ආයෝජන සිදු කිරීමට

*(ලකුණු 02)*

aat SRI LANKA

**(b)**

**(i)** ලබා දී ඇති තොරතුරුවලට අනුව, 'X' නිෂ්පාදනයේදී 'B' රට හා සසඳන විට 'A' රටට අඩු ශ්‍රම ඒකක ප්‍රමාණයක් අවශ්‍ය වේ. එබැවින්, 'X' නිෂ්පාදනයේ දී 'A' රටෙහි නිරපෙක්ෂ වාසිය ඇත. (X= 'A' රට)

'Y' නිෂ්පාදනයේදී 'A' රට හා සැසඳීමේ දී 'B' රටට අවශ්‍ය වන්නේ අඩු ශ්‍රම ඒකක ප්‍රමාණයකි. එබැවින්, 'Y' නිෂ්පාදනයේ දී 'B' රටෙහි නිරපෙක්ෂ වාසිය ඇත. (Y= 'B' රට)

*(ලකුණු 02)*

**(ii)**

| | *ආවස්ථික පිරිවැය - "X"* | *ආවස්ථික පිරිවැය - "Y"* |
|---|---|---|
| **A** | 4/8 = 0.5 | 8/4 = 2 |
| **B** | 6/3 = 2 | 3/6 = 0.5 |

'A' රටට 'X' නිෂ්පාදනයේ දී සාපෙක්ෂ වාසිය ඇති අතර, 'Y' නිෂ්පාදනයේ දී 'B' රටට සාපෙක්ෂ වාසිය ඇත.

*(ලකුණු 04)*

**(c) ගෙවුම් ශේෂයේ සටහන් කර ඇති ගනුදෙනු**

1 භාණ්ඩ වෙළෙඳාමේ ශේෂය
2 සේවා වෙළෙඳාමේ ශේෂය
3 ශුද්ධ ප්‍රාථමික ආදායම (මෙයට පොලී, ලාභ, විදේශ ආයෝජනවලින් ජනනය වන ලාභාංශ සහ සංක්‍රමණික ප්‍රේෂණ එනම් විදේශයන්හි ජීවත්වන සහ වැඩ කරන පුද්ගලයින්ගෙන් ලැබෙන ගෙවීම් ඇතුළත් වේ)
4 ශුද්ධ ද්විතියික ආදායම (මෙයට ලෝක සංවිධාන සඳහා වාර්ෂික දායකත්වය, හමුදා ආධාර, විදේශ සංවර්ධන ආධාර සහ යනාදිය ඇතුළත් වේ)
5 පේටන්ට් බලපත්‍ර, ප්‍රකාශන හිමිකම්, පුරස්කාර, කල්බදු සහ වෙනත් පැවරිය හැකි කොන්ත්‍රාත්තු සහ කීර්තිනාමය
6 වත්කම්වල අයිතිය පැවරීම
7 ඍජු විදේශ ආයෝජන
8 කළඹ ආයෝජන
9 බැංකු ශේෂය ගලා යාම

*(ලකුණු 02)*

*(මුළු ලකුණු 10)*

***B කොටසෙහි අවසානය***

aat SRI LANKA

(මුළු ලකුණු 20 යි)

**C කොටස**

## හයවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

**පරිච්ඡේදය 04 - ජාතික ගිණුම්කරණය හා රජයේ කාර්යභාරය**

**(A) (a)**

| | අයිතමය | රු. මිලියන |
|---|---|---|
| | පෞද්ගලික පරිභෝජන වියදම | 2,500 |
| | රජයේ පරිභෝජන වියදම | 5,000 |
| | දළ දේශිය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 4,500 |
| | තොග වෙනස්වීම | 2,456 |
| **(i)** | **වෙළෙඳපොළ මිලට දළ දේශිය වියදම (GDE)** | **14,456** |

(ලකුණු 05)

| | | රු. මිලියන |
|---|---|---|
| | **වෙළෙඳපොළ මිලට දළ දේශිය වියදම** | **14,456** |
| | එකතු කලා : අපනයන | 2,800 |
| | අඩු කලා : ආනයන | (5,789) |
| **(ii)** | **වෙළෙඳපොළ මිලට දළ දේශිය නිෂ්පාදිතය (GDP)** | **11,467** |

(ලකුණු 03)

| | | රු. මිලියන |
|---|---|---|
| | **වෙළෙඳපොළ මිලට දළ දේශිය නිෂ්පාදිතය** | **11,467** |
| | එකතු කලා : විදේශ ශුද්ධ සාධක ආදායම | (50) |
| **(iii)** | **වෙළෙඳපොළ මිලට දළ ජාතික ආදායම (GNI)** | **11,417** |

(ලකුණු 02)

SRI LANKA

**(b) මුලික මිල**

නිෂ්පාදකයා තම භාණ්ඩය හෝ සේවාව හෝ නිෂ්පාදනය කොට අලෙවි කිරීමට සුදුසුකම් කොට ඇති අවස්ථාවකදී එම භාණ්ඩය හෝ සේවාව සඳහා අදාළ මිල මූලික මිල නම් වේ. මෙය ගැණුම්කරුවාගෙන් නිෂ්පාදකයාට ලැබිය යුතු මිලකි. නිෂ්පාදනය මත පනවනු ලබන බදු මෙම මූලික මිලට ඇතුළත් නොවන අතර විකිණීමේදි නිෂ්පාදකයාට ලැබුණු සහනාධාර ඇතුළත් වේ. නමුත් නිෂ්පාදනය මත කිසියම් වෙනත් බද්දක් නිෂ්පාදකයා විසින් දරනු ලැබුවහොත් එම නිෂ්පාදනය මත පනවන ලද වෙනත් බදු අඩු කළ යුතු වේ. ප්‍රවාහන වියදම මූලික මිලට ඇතුළත් නොවේ. මුලික මිල නිෂ්පාදන තීරණ ගැනීමේදී අදාළ වේ.

(ලකුණු 02)

**(B) සාර්ව ආර්ථික ප්‍රතිපත්ති (ඕනෑම දෙකක්)**

**1. මුල්‍ය ප්‍රතිපත්තිය**

රජය සහ මහ බැංකුව මුල්‍ය ප්‍රතිපත්තිය භාවිත කරන්නේ එය බලපාන පරිදි මුදල් සැපයුමේ ප්‍රමාණය සහ අනුපාතය තීරණය කිරීමට;

- පොලී අනුපාතය
- විනිමය අනුපාතිකය

- රටක මිල සහ ආදායම් මට්ටම

මුදල් සැපයුම සහ පොලී අනුපාතය මුල්‍ය ප්‍රතිපත්තියේ ප්‍රධාන මෙවලම් වේ.

**2. පිස්කල් ප්‍රතිපත්තිය**

මෙම ප්‍රතිපත්තිය හරහා රාජ්‍ය ආදායම, රාජ්‍ය වියදම් සහ රාජ්‍ය ණය වෙනස් කිරීමට පියවර ගැනේ. රාජ්‍ය වියදම්, බදු සහ රාජ්‍ය ණය සම්බන්ධයෙන් ගනු ලබන තීරණ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ලෙස සැලකේ.

**3. සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්තය**

සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්ති සැලසුම් කර ඇත්තේ රටක නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම සඳහා වන අතර එමඟින් සමස්ත සැපයුම (AS) ඉහළ යයි. මෙම ප්‍රතිපත්ති නිෂ්පාදන සාධකවල ගුණාත්මකභාවය සහ ප්‍රමාණය වැඩිදියුණු කිරීම අරමුණු කර ගෙන ඇති අතර පෞද්ගලීකරණය, නියාමනය සහ බදු ප්‍රතිසංස්කරණ වැනි මෙවලම් මේ සඳහා යොදා ගැනේ.

**4. ආදායම් ප්‍රතිපත්තිය**

ප්‍රධාන වශයෙන් ආර්ථිකයේ උද්ධමන පීඩනය මැඩපැවැත්වීම සඳහා වැටුප් අනුපාත සහ මිල මට්ටම්වල ආර්ථිකය පුළුල් ලෙස ඉහළ යාම පාලනය කිරීමට රජය විසින් භාවිත කරන ප්‍රතිපත්තියය.

**5. විදේශ වෙළෙඳ ප්‍රතිපත්තිය**

නිදහස් ජාත්‍යන්තර වෙළෙඳාමට බලපෑම් කිරීමට පියවර ගැනීම විදේශ වෙළෙඳ ප්‍රතිපත්තිය ලෙස හැඳින්වේ. බදු සහ තීරුබදු, අපනයන සහනාධාර, ආනයන කෝටා, විනිමය අනුපාතිකය හැසිරවීම හිතකර වෙළෙඳ ශේෂයක් සාක්ෂාත් කර ගැනීම සඳහා භාවිත කරන එවැනි මෙවලම් වේ.

**6. සෘජු පාලනය ප්‍රතිපත්තිය**

නිදහස් වෙළෙඳපොළට මැදිහත් වීමට රජය ගන්නා ක්‍රියාමාර්ග, සම්පත්වල හිමිකාරිත්වය සහ බෙදාහැරීම පාලනය කිරීම අරමුණු කරගත් ප්‍රතිපත්ති සහ වෙළෙඳපොළ බලවේග හරහා තීරණය වන මිල සෘජු පාලනයන් ලෙස සැලකේ.

*(ලකුණු 04)*

aat SRI LANKA

**(C)**

**(a) රජයේ පුනරාවර්තන වියදම්**

වර්ෂයකට වැඩි කාලයක් සඳහා නිෂ්පාදන ක්‍රියාවලීන්හි භාවිත කරනු ලබන මූර්ත වත්කම් අත්පත් කරගැනීම සහ ප්‍රාග්ධන සංක්‍රාම සඳහා කරනු ලබන වියදම් හැර අනෙකුත් වියදම් සියල්ල ම පුනරාවර්තන වියදම් සේ සැලකේ.

*(ලකුණු 02)*

**(b)** පුනරාවර්තන වියදම්වල ප්‍රධාන වර්ග තුනක් (03) ඇත

- භාණ්ඩ හා සේවා සඳහා කෙරෙන පුනරාවර්තන වියදම්
- පොලී ගෙවීම්
- වර්තන සංක්‍රාම සහ සහනාධාර

*(ලකුණු 02)*

*(මුළු ලකුණු 20)*

***C* කොටසෙහි අවසානය**

## *Notice:*

These answers compiled and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.

These should be understood as Suggested Answers to questions set at AAT Examinations and should not be construed as the “Only” answers, or, for that matter even as “Model Answers”. The fundamental objective of this publication is to add completeness to its series of study texts, design especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well and stay relevant in the art of answering questions at examination level.

*© 2021 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka). All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*